# කොවිඩ් - 19 - සති පාසල 2021

## සබරගමු පළාත - නිවිතිගල අධ්‍යාපන කලාපය

## 9 ශ්‍රේණිය - ඉතිහාසය 2021



11 වන සතිය 2021 නොවැම්බර් 08 – 2021 නොවැම්බර් 14

ඒකකය - 06 -- නිදහසින් පසු ශ්‍රී ලංකාව

ක්‍රියාකාරකම :- 04 -- පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිලිබඳ සොයා බලමු

හැදින්වීම :- 1948 සිට 1972 දක්වා බ්‍රිතාන්‍යයන් විසින් හදුන්වා දෙනලද සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙරට ක්‍රියාත්මක විය. මෙම ව්‍යවස්ථාව යටතේ බ්‍රිතාන්‍ය රැජිණ තවදුරටත් මෙරටෙහි රාජ්‍ය නායිකාව ලෙස පිළිගැනීමත් නීති සම්පාදනයේදී පාර්ලිමේන්තුවට නොයෙකුත් සීමාවන් පැවතීමත් වැනි හේතු නිසා ශ්‍රී ලාංකිකයන් ලැබූ නිදහස අංග සම්පූර්ණ නැතැයි යන අදහසක් විය. මෙමෙ නිසා මෙරට බ්‍රිතාන්‍ය රජයෙන් පූර්ණ නිදහසක් දිනා ගැනීමට නම් නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් සම්පාදනය කරගැනීමේ අවශ්‍යතාවයන් පවතින. මේ අනුව 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව සම්පාදනය කර තිබේ.

පියවර 1 :- පෙල පොතේ පිටු අංක 120 සිට 123 දක්වා හොඳින් කියවගන්න.

පියවර 2 :- ඉහතින් දක්වා ඇති හැදින්වීම සටහන් කරගන්න.

පියවර 3 :- පහතින් දක්වා ඇති ප්‍රශ්නාවලියට පිළිතුරු සපයන්න.

ප්‍රශ්නාවලිය :-

01. 1970 මැතිවරණයේ ජයගත් පක්ෂය කුමක්ද ?
02. එම මැතිවරණයෙන් පත්වූ අගමැතිවරයා කවුරුන්ද ?
03. දිනාගත් 2/3 ක බහුතරය උපයෝගී කරගනිමින් සම්පාදිත ව්‍යවස්ථාව කුමන නමකින් හැදින්වේද ?
04. පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ඇතිකල පාර්ලිමේන්තුව කුමන නමකින් හදුන්වා තිබේ ද ?.
05. ජාතික රාජ්‍ය සභාවේ කාර්යයන් ලියා දක්වන්න.
06. ලංකාවට පත්වූ ප්‍රථම ජනාධිපතිවරයා නම්කරන්න.
07. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය පත්කළේ කෙසේද
08. 1972 පිහිටවූ අධිකරණ ආයතන නම්කරන්න
09. බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලය යනු කුමක්ද ?
10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ කාර්ය භාරය ලියා දක්වන්න

සැකසුම :- උදාර අරවින්ද - නිවිතිගල අධ්‍යාපන කලාපය - ර/කලවන ජාතික පාසල